# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2105/47 - 2019 ජනවාරි මස 11 වැනි සිකුරාදා - 2019.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2018 අංක 35 දරන මුදල් පනත**

නිවේදනය

2018 අංක 35 දරන මුදල් පනතේ 51 වැනි වගන්තිය සමග කියවිය යුතු 41(3) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් පහත සඳහන් නියෝග නියම කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2019 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග, 2019 අංක 1 දරන මුදල් (කාබන් බද්ද) නියෝග ලෙස හඳුන්වනු ලැබිය හැකිය.

2. කාබන් බද්ද (මෙහි මින් මතු ''බද්ද'' යනුවෙන් සඳහන් කරනු ලබන), යම් අදාළ මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් ගෙවිය යුතු අතර 2018 අංක 35 දරන මුදල් පනතේ XI වන කොටසට අනුකූලව ප්‍රාදේශීය ලේකම් විසින් එකතු කරනු ලැබිය යුතු ය. මෝටර් වාහනයේ වාර්ෂික ලියාපදිංචි කිරීම අලුත් කිරීම සිදු කරනු ලබන්නේ පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයකු විසින් නම්, මෝටර් වාහනයේ වාර්ෂික ලියාපදිංචි කිරීම අලුත් කිරීම සිදු කරනු ලබන අවස්ථාවේදීම එම කොමසාරිස්වරුන් විසින් බද්ද අයකළ යුතු ය.

මාර්ගගත ක්‍රමයට මෝටර් වාහනයේ වාර්ෂික ලියාපදිංචි කිරීම අලුත් කිරීම සිදු කරනු ලබන අවස්ථාවකදී, අදාළ මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අවස්ථානුකූලව ප්‍රාදේශීය ලේකම්වරයාට හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාට මෙම බද්ද වෙනමම ගෙවිය යුතු ය.

3. අවස්ථානුකූලව, මෙම බද්ද එකතු කරනු ලබන යම් ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයකු, යම් මාසයකදී ඉහත 2 වන ඡෙදයට අනුව එකතු කරනු ලබන මුදල ඉක්බිතිව එළඹෙන මාසයේ 10 වන දින හෝ එදිනට පෙර ඒකාබද්ධ අරමුදලේ බැරට ප්‍රේෂණය කළ යුතු ය.

4. යම් ප්‍රාදේශීය ලේකම්වරයකු හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයකු විසින් එකතු කරන ලද සහ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද බද්ද සම්බන්ධයෙන් මාසික ආදායම් වාර්තාවක් මෝටර් වාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

01 - 751

1A - PG 4357 — 542 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*